**ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 23 ක රු.79,600,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.51,482,224 ක් හෙවත් සියයට 65 ක ඉතිරි කිරීම් පැවති අතර වැය විෂයයන් අතර එම ඉතිරිවීම් සියයට 53 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක පැවතුණි. | රාජ්‍ය වියදම් කළමනාකරණ පිළිබඳ නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් බලය ලබා දීම, අමාත්‍ය කාර්ය මණ්ඩලයේ රියදුරු සේවයේ නිලධාරී පුරප්පාඩු පැවතීම, අමාත්‍යාංශය නව පරිශ්‍රයේ ස්ථාපිත කිරීම ප්‍රමාද වීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| i. | මුදල් රෙගුලාසි 104 (3), 104 (4) | | වාහන අනතුරක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා වැඩි ප්‍රමාදයක් සිදු වේයැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවීමට කටයුතු කළ යුතු වුවද, අනතුර සිදු වී දින | වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. 104 (3) හා 104 (4) පරීක්ෂණ පැවැත්වීම සඳහා මූලික පියවර ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 114 ත් 204 ත් අතර වූ කාලයක් ගතවී තිබුණු වාහන 03ක් සඳහා ප්‍රාරම්භක වාර්තාවක් හෝ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත්, අනතුරු සිදු වී දින 197 ක් හා 199 ක් ගතවූ වාහන 02ක් සඳහා පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| ii. මුදල් රෙගුලාසි 1642 | වාහන භාවිතා කරන නිලධාරීන් විසින් හෝ නිලධාරීන් නොමැති අවස්ථාවක රියදුරන් විසින් සිදුවන සියලුම හදිසි අනතුරු ළඟම ඇති පොලීසියට දැන්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 03 ක් හා 2024 ජනවාරි මස සිදු වූ වාහන අනතුරක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් තරයේ අවවාද කිරීමට පියවර ගන්නා ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අනතුරු සම්බන්ධව ළඟම ඇති පොලිසීයට දැනුම් දීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ විෂය යටතට අයත් ආයතනයන්හි විෂයයන්, කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වුවද, අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු දෙකක සහ අරමුදලක සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් රු.23,094,700 ක් වූ කාර්යයන් 38 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. | පැවති ආර්ථික අර්බුදය නිසා භාණ්ඩ මිල ඉහළයාම නිසා අමාත්‍ය මණ්ඩලය හා මහා භාණ්ඩාගාරය ලබා දුන් උපදෙස් පරිදි අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ඒ යටතේ ඇති ව්‍යවස්ථාපිත අරමුදල්වල සැලසුම් ප්‍රතිශෝධනය කර විෂය පථය සීමා කිරීමට උපදෙස් දීමට සිදු විය. | අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල කාර්යයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක බැංකු (IBRD) ණය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතන (IDA) ණය හා ප්‍රතිපාදන සම්බන්ධයෙන් 2011 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7 වගන්තිය ප්‍රකාරව සෘජු ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීමට හා අදාළ සැපයුම්කරු තෝරා ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තහවුරු කිරීම් ලෝක බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු නමුත් ඇස්තමේන්තුගත වටිනාකම රු.793,534,305 ක් වූ වන විද්‍යා ආයතනයේ වැඩ අවසන් නොකළ ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්තු සඳහා එවැනි තහවුරු කිරීම් ඉදිරිපත් කළ බවටත්, ලෝක බැංකුවෙන් සෘජු ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීම සඳහා අනුමැතියක් ලබා දුන් බවටත් සනාථ නොවීය. එසේම 2023 මාර්තු මස 01 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී තීරණය වී තිබූ පරිදි එම ඉතිරි වැඩ කොටස් නව සමාගම් වෙත පැවරීමේදී එකඟ වූ මිල ගණන් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම ඉදිකිරීම් සඳහා දේශීය අරමුදල් නොසපයන බවට වූ කොන්දේසි පරිදි ලෝක බැංකු එකඟතාව මත නුවරඑළිය වන විද්‍යායතනයේ ඉතිරි ඉදිකිරීම් නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා ඊට අනුබද්ධ ඉදි කිරීම් සමාගම වන මධ්‍යම ඉංජිනේරු සේවා සමාගම මඟින් සිදු කර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුවේ නිර්දේශිත රේටයන්ට යටත් ව ගෙවීම් සිදු කර ඇත. | සෘජු ප්‍රසම්පාදන ක්‍රමයන් අනුගමනය කිරීම සඳහා ලෝක බැංකු අනුමැතිය ලබාගැනීමට සහ එකඟ වූ මිල ගණන් සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | මුල් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1345 ක් වූ වන විද්‍යායතනයේ ඉදිකිරීම් කටයුතු මුල් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණ පත්‍ර (BOQ) අනුව සියයට 50 කට වඩා නිම කර තිබියදී ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා රු.793,534,305 ක | වන විද්‍යායතනයේ ඉදිකිරීම් සඳහා ද්විගණනයක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇත. | විදේශාධාර ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද මෙම ඉදිකිරීමට අදාළව වැඩිපුර ගෙවා තිබුණු වියදම් සඳහා වගකිව යුතු නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත වටිනාකමකට නව සමාගම් 02 ක් වෙත පිරිනමා තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්කරු විසින් කණිෂ්ඨ සේවක මණ්ඩල නිල නිවසේ ඉදිකිරීම් කටයුතු නතර කරන අවස්ථාව වන විට විදුලි සවි කිරීම්, නාන කාමර හා වැසිකිලි බිත්ති ජල කාන්දු වීම් වළක්වා ගැනීම සඳහා තීන්ත ආලේප කිරීම (Water Proof ) සහ පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම යන කටයුතු සියයට 60 කට වඩා අවසන් කර තිබියදී සම්පූර්ණ කරන ලද වැඩ කොටස් ද ඇතුළත් කර ප්‍රමාණ පත්‍ර සකස් කර නව සමාගම වෙත පවරා තිබීම හේතුවෙන් රු.8,586,182 ක වැඩිපුර වියදමක් දැරීමට සිදු වී තිබුණි. | | හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ගම්මාන සහ කුඹුරු වටා විදුලි වැට ඉදි කිරීම සඳහා මිලදී ගන්නා ලද උපකරණවලින් අදාළ සමිතිවලට හා අනුරාධපුර හා කුරුණෑගල ගොවිජන සංවර්ධන සහකාර අධ්‍යක්ෂ කාර්යාලවලට භාණ්ඩ නිකුත් කිරීමෙන් අනතුරුව රු.80,740,804 ක උපකරණ සහ එනජයිසර් බල ගැන්වීම සඳහා මිලදී ගන්නා ලද රු.534,400 ක 12V (90Am) බැටරි 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන රිටිගල, මොරගොඩ හා මහ දිවුල්වැව වනජීවී බීට්ටු කාර්යාල පරිශ්‍රයන්හි අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ කාල සීමාව අවසන් වූ 2023 මැයි 31 දින වන විට එම දිස්ත්‍රික්ක 02හි ඉදිකළ යුතු 47 ක් වූ ගම්මාන වටා වැට සංඛ්‍යාවෙන් වැට 07 ක් අඩක් පමණක් නිමකර තිබුණු අතර වැට 09 ක ඉදිකිරීම් ආරම්භ කර හෝ නොතිබුණි. | විදුලි වැට ඉදිකිරීම සඳහා මිලටගත් උපකරණවලින් ඉතිරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට ලබා දී ඇත. ම අරමුදලක් පිහිටුවීමට නොහැකි වූ සමිතිවලට අලිවැට උපකරණ නිකුත් කිරීමට නොහැකි වීම නිසා මෙම උපකරණ ඉතිරි වූ අතර නැවත මෙම ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීමට කටයුතු කර ඇත. | වැට ඉදිකිරීම, නඩත්තුව හෝ පසු විපරම් කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකරන බවට එම දෙපාර්තමේන්තුව විසින් විගණනයට දැනුම් දී ඇති හෙයින් මෙම උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කර අපේක්ෂිත ආකාරයට වැට ඉදිකර නඩත්තු කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවට යොමු කර වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන | රිටිගල වනජීවී කාර්යාලයය තුළ තාවකාලික ව ඉදි කරන මඩුවේ තිබූ | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර, වගකිව යුතු නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම රු.2,818,200 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම තක්සේරු නොකළ nut & bolt 122 ක් සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ අතර එම අලාභය සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සොරුන් විසින් පැහැර ගෙන ගොස් තිබූ උපකරණ පිළිබඳව පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර ඇත. | හඳුනාගෙන අලාභය අයකර ගැනීමටත් පියවර ගත යුතුය. |
| (ඉ) | විදුලි වැට ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබූ Tension Spring ඒකක 3183 න් ඒකක 56 ක් පමණක් විදුලි වැටවල් සඳහා නිකුත් කර තිබීමෙන් රු.7,817,500 ක් වටිනා ඒකක 3127 ක් ද රු.1,408,500 ක් වටිනා විදුලි වැටට හානියක් සිදුවන අවස්ථාවකදී නාද වන Fence voltage alarm with siren and flashlight ඒකක 09 ක් ද මොරගොඩ වනජීවී බීට්ටු කාර්යාලයේ ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | ග්‍රාමීය විදුලිවැට හා කුඹුරුවටා විදුලිවැට සඳහා මිලටගත් Tension Spring වලින් ඉතිරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා ලබා දී ඇත. | විදේශාධාර ව්‍යාපෘති යටතේ මිලදී ගත් මෙම උපකරණ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දොපර්තමේන්තුවේ කටයුතු මෙහෙය වීමට හා පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ කැබ් රථයක් 2023 ඔක්තෝම්බර් 16 දින ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ගාල් කරන අවස්ථාවේදී රියදුරු නොමැතිව ස්වයංක්‍රීයව ධාවනය වීමෙන් සිදු වී තිබූ අනතුර සඳහා ඇස්තමේන්තු කරන ලද හානිය රු.988,226 ක්, “සුදුසු ආරක්ෂණ ක්‍රියාමාර්ග ගෙන නොතිබීම” හේතුවෙන් සිදු වූවක් බැවින් හානිය පූර්ණය කළ නොහැකි බවට 2024 පෙබරවාරි 28 දින ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් දැනුම් දී තිබුණි. එසේ වුවත් මෙම අනතුර සම්බන්ධ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිව යුතු අයගෙන් අලාභ අයකර ගැනීමට 2024 අප්‍රේල් 30 වන විටත් කටයුතු කර නොතිබුණි. | සිදු කරන ලද අභ්‍යන්තර විමර්ශනයක් අනුව සුදුසු ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කර ඇති බව යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය වී තිබුණු අතර රක්ෂණ සමාගම වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව එයට රක්ෂණ සමාගම දක්වන ප්‍රතිචාරය මත පරීක්ෂණ අවසන් කර සුදුසු ආකාරයෙන් මෙම අනතුරෙහි හානිය අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත ය. | මෙම අනතුර සම්බන්ධ පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වගකිව යුතු අයගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ 153 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 42 ක් පුරප්පාඩු වී පැවති අතර අනුමත සේවක සංඛ්‍යාව තුළ නොමැති බහුකාර්ය සහායකයින් 07 දෙනෙකුගෙන් යුත් අතිරික්ත කාර්යය මණ්ඩලයක් ද විය. පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්, තෘතික මට්ටමේ තනතුරු 02 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 17 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් ඇතුළත් විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීය මට්ටමේ සහ ද්විතීය මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරින් ලබා ගැනීම සඳහා කැබිනට් මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | කාර්යසාධනයට අහිතර ලෙස බලපාන පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍ය ආකාරයට කාර්ය මණ්ඩලය සංශෝධන කර ගැනීමට කටයුතු කළ යුතුය. |